**තංගල්ල ප්‍රාදේශීය සභාව - 2020**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. තත්ත්වාගණනය කළ මතය**

තංගල්ල ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍යයන් සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත්වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු පිළිවෙලින් රු.6,685,240 ක් හා රු. 17,865,779 ක් ලෙස එකතුව රු. 24,551,019 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2019 වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු. 6,685,240 ක් අඩුවෙන් ගිණුම්ගත කළ බව සහ 2021 වර්ෂයේ සියලුම උපලේඛන ලද පසු ගිණුම නිවැරදි කරමි. | අදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2018 හා 2019 වර්ෂයන්ට අදාළ රු. 2,152,804 ක් වූ වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියට මෙවැනි අතපසුවීම් ඇති නොවීමට කටයුතු කරමි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | අනියම් පදනමින් සේවයේ නියුතු තිදෙනෙකු සේවයේ ස්ථිර කිරීමේදී සභාවට ලැබිය යුතු සේවක අර්ථසාධන අරමුදලේ සියයට 12 ක දායක මුදල වූ රු. 407,771 ක් වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි. | සභාවට ලැබිය යුතු සේවක අර්ථසාධක අරමුදලේ රු.407,771 ක දායකය ලබා ගැනීම සඳහා විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත දැන්වූයෙමි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු. 321,054 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | තංගල්ල දිසා අධිකරණයෙන් සහ අඟුණකොළපැලැස්ස දිසා අධිකරණයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ශේෂය රු. 9,080,070 ක් බව. | ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී රු. 261,462 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරමි. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ සිට ඉදිරියට එමින් පවතින රු. 17,252 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය අදාළ ගැලපීම් නොකර සමුච්ඡිත අරමුදලට ගලපා තිබුණි. | 2017 වර්ෂයට අදාළ මෙම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගෙන කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 47,982,908 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළව විගණයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විස්තරාත්මකව තොරතුරු සහ ශේෂ සනාථන සහතික ඉදිරියේදී ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,014,619 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායමරු. 53,444,656 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණයෙ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ දෙසැම්බර් මස පිළියෙල කළ ජංගම ගිණුමේ බැංකු සැසඳුම් ප්‍රකාශයේ අත ඉතිරිය රු. 750,000 ක් වුවත් එදිනට භෞතිකව අත ඉතිරි මුදල් ශේෂයක් නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී බැංකු ගිණුමට රු. 443,562 ක ගැළපීම් කළ පසු ඉතිරිය වූරු. 306,438 ක් හඳුනා නොගත් ශේෂයක් ලෙස දක්වමින් බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙලකර තිබුණි. | රු. 306,438 ක ශේෂය හඳුනා ගැනීමට කටයුතු කරන බව. | ශේෂය හඳුනා ගෙන නිරවුල් කළ යුතුය. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වෙනත් බදු** | | |
| i. | ලැබිය යුතු ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රු. 128,580 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| ii. | ලැබිය යුතු අක්කර බදු රු. 168,863 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර ලැබිය යුතු අක්කර බදු සඳහා කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් කඩිනමින් අයකර ගනිමි. | -එම- |
| iii. | ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 83,800 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ දැන්වීම් පුවරු ගාස්තු ඉදිරියේදී අයකර ගනිමි. | -එම- |
| (ආ) | **කුලී** | | |
| i. | ලැබිය යුතු කඩ කුලී රු. 783,003 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟයන් අයකර ගැනීමට කටයුතු කරන බව සහ යායවත්ත කඩ සඳහා එන්තරවාසි යැවීමට කටයුතු කරමි. | -එම- |
| ii. | සභාවේ දේපල බදු දීම මත දේපල 05 කින් ලැබිය යුතු කුලී හා දඩ මුදල් රු. 620,796 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අයකර ගැනීමට නීති මඟින් කටයුතු කරමි. | -එම- |
| iii. | පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො / 2010 / 01 දරන චක්‍රලේඛනයේ 04 වන ඡේදය පරිදි 2018 වර්ෂයේදී ගිවිසුම්ගත වූ කඩ කාමර 03 ක් සඳහා අයකළ යුතු එක්වන් මුදල් රු. 60,000 ක් අයකර ගෙන නොතිබුණි. | ඉතිරි රු. 60,000 අයකර ගැනීමට කටයුතු කරමි. | චක්‍රලේඛනය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු රු. 45,413,180 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු ලබා ගැනීමට ප්‍රධාන ලේකම් දැනුවත් කළෙමි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |

## 3. **මෙහෙයුම් සමාලෝචනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කරුණු විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 **ප්‍රසම්පාදන කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- |
| හුම්මාන නැරඹුම් මධ්‍යස්ථානයේ දේශීය ටිකට් පත් 100,000 ක් මුද්‍රණය කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩල තීරණය ලැබීමට පෙර පෞද්ගලික ආයතනයකට ගෙවීම සිදුකර තිබූ බැවින් මිලදී ගත යුතු ආයතනය කලින්ම තීරණය කර ප්‍රසම්පාදන ක්‍රියාවලියේ විනිවිදභාවයක් ඇති බව දැක්වීම සඳහා ආයතන 05 කින් මිල කැඳවීම් කර තිබුණි. | එවකට සිටි විෂය නිලධාරියා ආයතනයේ නොසිටින අතර අවශ්‍යතාවය මත ටිකට්පත් මුද්‍රණය කළෙමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |